**කොළඹ විශ්වවිද්‍යාලය - අධ්‍යාපන පීඨය**
**අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයනාංශය**

# මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව 2025/2026

ඉහත සඳහන් පාඨමාලාවට ඇතුළත් කරගැනීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයනාංශය විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා නියමිත සුදුසුකම් ඇති,

- පාසල්, විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල උපදේශන හෝ උපදේශන සේවා පරිපාලන කටයුතු හෝ ඉගැන්වීමේ නිරතවන අයට
- රාජ්‍ය අංශයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු හෝ ආයතනවල උපදේශන සේවා ක්ෂේත්‍රයේ නියැළි අයට
- පෞද්ගලික අංශයේ උපදේශනය අදාළ වන වෘත්තීන්හි නියැලි හෝ විශ්‍රාමික හෝ උපදේශනයේ නියැලීමට අපේක්ෂා කරන අයට අයදුම් කළ හැකිය.

***පාඨමාලාවේ අරමුණු***: උපදේශන සේවා ක්ෂේත්‍රයට සුදුසු විද්වත් උපදේශන වෘත්තිකයින් බිහි කිරීම හා එමගින් ශ්‍රී ලංකාවේ පාසල්, රාජ්‍ය/පෞද්ගලික ආයතනවල උපදේශන සේවාවේ දායකත්වය පුළුල් කිරීම.

***පාඨමාලා ගාස්තු***: රු. 185,000/-
***කාලය*** **:** මාස 15
***මාධ්‍යය***: සිංහල

***දේශන හා පුහුණුව*** : සෙනසුරාදා හා ඉරිදා දිනවල දී

***අයදුම්පත් භාරගන්නා අවසාන දිනය*** : 2024 නොවැම්බර් 30

***ඇතුළත්වීමේ සුදුසුකම්, අයදුම්පත් හා පාඨමාලාවේ විස්තර*** **:**

තම පෞද්ගලික ලිපිනය ලියූ රු.100/-ක මුද්දර අලවන ලද සෙ.මී. 22 x 10 ප්‍රමාණයේ ලියුම් කවරයක් **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයනාංශය, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ 3.** යන ලිපිනයට එවීමෙන් හෝ පැමිණ හෝ http://edu.cmb.ac.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකිය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින්, කොළඹ විශ්වවිද්‍යාලයේ අංක 306061700005 දරන ගිණුමට රු. 1500/-ක් බැර කරන ලද රිසිට් පත සමග ඉහත ලිපිනයට එවිය යුතුය.

විමසීම්- 011-2504734/011-2596888

ලේඛකාධිකාරී
කොළඹ විශ්වවිද්‍යාලය